F - ០។

# ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය විවිධත්වය සහ ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන සැළැසුම් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විමසුමක්

ඇම්. රත්නායක,
(භූගෝල විද්‍යා අධ්‍යායනාංශය, රුහුණ විශ්ව විද්‍යාලයීය විද්‍යායතනය)

අන්තර් ජාතික මට්ටමෙන් රටවල් අතර පවතින විවිධත්වය මෙන්ම ශ්‍රී ලංකාව තුළද දිස්ත්‍රික් මට්ටමෙන් විශාල විවිධත්වයක් දක්නට ලැබේ. මෙම විවිධත්වය සලකා බැලීමත්, එම විවිධත්වයට අනුකූලවන පරිදි සංවර්ධන සැළසුම් කිරීමත් පිළිබඳව මෙම අධ්‍යයනයෙන් විමසා බැලේ. දිස්ත්‍රික් මට්ටමේ විවිධත්වය පහත සඳහන් අංශ වලින් සලකා බලනු ඇත.

1. **ජනගහනය සම්බන්ධ කරුණු**–ජන ඝනත්වය, යැපුම් අනුපාතය, ග්‍රාමීය නාගරික ජන අනුපාතය, සේවා නියුක්ති අනුපාතය, උපත් අනුපාතය, මරණ අනුපාතය, ස්වාභාවික වර්ධනය ආදිය.
2. **නිවාස තත්ත්වය**–ස්ථිර නිවාස ප්‍රතිශතය, නිවාස ඝනත්වය, නිවසක සාමාන්‍ය ප්‍රමාණය, විදුලිය සහිත නිවාස ප්‍රතිශතය, නල ජලය සහිත නිවාස ප්‍රතිශතය, ආදිය.
3. **අධ්‍යාපන තත්ත්වය**–ලිවීමේ හා කියැවීමේ හැකියා අනුපාතය, අවුරුදු 14 ට වැඩි පාසල් යන ශිෂ්‍ය අනුපාතය, ගුරු-ශිෂ්‍ය අනුපාතය, කුඩා පාසල් අනුපාතය, විද්‍යා ගුරුවරුන්ගේ අනුපාතය, ආදිය.
4. **සෞඛ්‍ය තත්ත්වය**–ජීවිත අපේක්ෂාව, එක් වෛද්‍ය වරයකුට අයත්වන ජන සංඛ්‍යාව, මන්දපෝෂණ අනුපාතය, රෝහල් ව්‍යාප්තිය, ආදිය.
5. **ආර්ථික තත්ත්වය**–කෘෂිකර්මාන්තයේ යෙදී සිටින ජන අනුපාතය, කාර්මික කටයුතු වල යෙදී සිටින ජන අනුපාතය, ඒක පුද්ගල කාර්මික හා කෘෂිකාර්මික නිෂ්පාදනය, රජයේ මුදල් වෙන්කිරීමේ අනුපාතය, ආදිය.

SECTION F

මෙම සාධකවල ප්‍රාදේශීය විවිධත්වය 1971 හා 1981 ජන සංගනන දත්ත ආශ්‍රයෙන් හා මෑත වර්ෂවල ලබාගත් දත්ත ආශ්‍රයෙන් විමසා බැලේ.

ඉහත සඳහන් සාධක මත ප්‍රාදේශීය විවිධත්වය සහ ප්‍රාදේශීය අවශ්‍යතා දිස්ත්‍රික් මට්ටමෙන් හඳුනා ගැනේ. එසේ හඳුනාගත් ලක්ෂණයන්ට අනුකූල වන පරිදි ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන සැළසුම් කිරීමේ අවශ්‍යතාවය පෙන්වාදීමත් ඒ සඳහා පවතින බාධක හැඳින්වීමත් කර ඇත. මෙතෙක්කල් ක්‍රියාත්මක වූ ජාතික මට්ටමේ සැළසුම් වලින් සිදුවූ සේවය තුලනාත්මකව අගැයුම් කරන අතර ප්‍රාදේශීය මට්ටමේ සැළසුම්වල වැදගත්කම ඉස්මතු කෙරේ. ඒ සඳහා දැනට ක්‍රියාත්මක කෙරෙන ප්‍රාදේශීය මට්ටමේ සැළසුම් පිළිබඳව අගැයුමක් කෙරෙනු ඇත. මෙම අධ්‍යයනයේ අවසාන පරමාර්ථය වන්නේ ප්‍රාදේශීය මට්ටමේ සැළසුම් කිරීමේ අවශ්‍යතාවය පෙන්වාදීම සහ ඒ සඳහා ක්‍රියාමාර්ගයක් යෝජනා කිරීමයි.